**පසුම්බිම් කතාව**

මට සන්නස්ගල මහතාව හමු වන්නේ අහම්බයකින්, ඒ පොත් කට්ටල කිහිපයක් බණ්ඩාරවෙලට රැගෙන යාමට උදව් ඉල්ලා ඔහු 2023-01-08 දින facebook හි පළකර තිබුණු පොස්ට් එකකින්. එහි පවසා තිබුනේ සම්මන්ත්‍රණයක් සඳහා පොත් කට්ටල කිහිපයක් බණ්ඩාරවෙලට රැගෙන යා යුතු බවත්, බණ්ඩාරවෙල යන කෙනුකු සිටිනම් ඔහු හා සම්භන්ද වන ලෙසටත්.

ඒ දින වල මාද බණ්ඩාරවෙල, හපුතලේ යන ප්‍රදේශ වලින් ඉඩමක් මිලදී ගැනීම සඳහා සොයමින් සිටි අතර සෑම සති අන්තයකම වගේ බණ්ඩාරවෙල හෝ අවට ප්‍රදේශ වලට ගමන් යොදා ගන්නට යෙදී තිබුණා. ඉතින් එදින ද ඉරිදා දිනයක් වූ බැවින් මටද බණ්ඩාරවෙල යෑමට අදහසක් තිබුණා. ඒ නිසා මේ උපකරයද ඒ ගමනෙන්ම සපුරාලිය හැකි නිසාත්, රැගෙන යාමට තිබුනේ ළමුන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය වන පොත් නිසාත් මම ඒ පල කර තිබු පොස්ට් එක හරහා සන්නස්ගල මහතා සම්භන්ද කරගෙන ඔහු අපේක්ෂා කරන උදව්ව කර දීමට හැකි බව පවසා සිටියා.

ඉන්පසු ඔහු හා දුරකතනයෙන් සම්භන්ද වී ඔහුගේ නුගේගොඩ විජේරාමේ පිහිටි Royal Thaprobanian නම් ස්ථානයෙන් පොත් ටික ලබා ගැනීම සඳහා එදිනම උදේ 11.30 පමණ වන විට මා සහ මගේ බිරිඳ පැමිණියා. සන්නස්ගල මහතාව පළමු වරට මට මුණ ගැහුනේ එම අවස්ථාවේදී.

තොරතුරු සාකච්චා කිරීමෙන් පසුව ඔහු අපිට කෝපි වලින් සංග්‍රහ කළා. කතාබහ අතරදී මා බණ්ඩාරවෙල නිතර යන හේතුව පැවසු විට ඔහු පවසා සිටියේ ඔහුටද හපුතලේ ප්‍රදේශයේ ඔහුට අයත් ඉඩමක් ඇති බවයි. තවත් ටික වෙලාවක් කතා බහ කිරීමෙන් අනතුරුව බණ්ඩාරවෙල යාමට පමාවන නිසා අපි පොත් කට්ටල කිහිපයද වාහනයේ පටවාගෙන එතනින් පිටත් උනා. එදිනම හවස් වන විට අපි එම පොත් කට්ටල කිහිපය අදාල පුද්ගලයන්ට භාරදෙන්නට අපිට හැකි උනා.

එම කාර්ය අවසන් කිරීමෙන් පසු මා සන්නස්ගල මහතාට whatsapp හරහා voice message එකක් තබමින් ඒ බව දැනුම් දුන්නා. ඔහුද පිළිතුරක් එවමින් කල උපකාරය සඳහා ස්තුතිවන්ත උනා. මාද නැවත පිළිතුරක් යවමින් සඳහන් කලේ නැවත උපකාරයක් අවශ්‍ය වුවහොත් පවසන ලෙසත්.

එයින් දින කිහිපයකට පසු මගේ බිරිඳ මට දන්වා සිටියේ සන්නස්ගල මහතා චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමට යන බවත් ඒ සඳහා crowdfunding යටතේ අපටද උපකාර කල හැකි බවත්. ඉතින් මාද ඒ අදහසට එකඟ වූ නිසා මා සුළු ආධාරයක් ඒ සඳහා කරන්නේ කෙසේදැයි සන්නස්ගල මහතාගෙන් විමසා සිටියා. මා ලොකු මුදලක් ඒ සඳහා පරිත්‍යාග කිරීමට බලාපොරොත්තු නොවුනත් ඔහු ඒ පිලිබඳ සාකච්චා කිරීමට thaprobanian ආයතනයට එන ලෙස මට අරාධනා කළා.

ආරාධනාව පිළිගත් අපි 2023-01-18 වන දින හවස 8 පමණ දෙවන වරටත් Royal Thaprobanian ආයතනයට ගියා. එහිදී ඔහු අපට Thangamale Diaries චිතපටයේ Line Producer වන නලින්ද ප්‍රේමරත්න මහතාව හඳුන්වා දුන්නා. ආධාරය කරන ආකාරය ඔහු සමග සාකච්චා කර ගන්නා ලෙස දැනුම් දුන්න. එහිදී ඔහු පවසා සිටියේ ලක්ෂ දහයට අඩු මුදල් ලබාදීම් ආධාර ලෙස භාර ගන්නා බවත්,

ලක්ෂ දහය හෝ වැඩි මුදල් ලබා දීම් සඳහා සම නිෂ්පාදන ලෙස භාර ගන්නා බවත් එවැනි මුදල් ලබා දීම් නීතිඥ වරයකු හරහා ගිවිසුම් ගත වීමකින් පසුව ලබාගන්න බවත්ය.

එවන් මුදලක් පරිත්‍යාග කිරීමට හෝ ආයෝජනය කිරීමට මා හට බලාපොරොත්තුවක් නොතිබුණු බැවින් මා පිළිතුරක් ලබා නොදුන් අතර මා ඉන්පසු ඒ පිලිබඳ වැඩි උන්දදුවක් දැක්වුයේ නෑ.

**තන්ගමලේ ඩයරිස් මුහුරත් උළෙල**

ඉන් සති කිහිපයකට පසු සන්නස්ගල මහතා Whatsapp හරහා ආරාධනා පත්‍රයක් එවමින් මට දන්වා සිටියේ තංගමලේ ඩයරිස් චිත්‍රපටයේ මුහුරත් උළෙල 2023-02-14 දින දියත උයනේදී පවත්වන බවත් මාගේ බිරිඳද සමගින් ඒ හා සහභාගී වන ලෙසටත්ය. මා ආරාධනය පිලි ගත් අතර ඔහුගේ මුහුරත් උළෙල සඳහා 2023-02-14 වන දින මා හා මගේ බිරිඳ අමුත්තන් ලෙස සහභාගී වූවෙමු.

එදිනට දින කිහිපයකට පසු නැවතත් මා ඔහුට Whatsapp පණිවිඩයක් හරහා දැනුම් දුන්නේ චිත්‍රපටය වෙනුවෙන් සුළු උපකාරයක් කිරීමට හැකි බවත් ඒ සඳහා බැංකු ගිණුම් අංකයක් ලබාදෙන ලෙසත්ය. ඒ Whatsapp පණිවිඩය සඳහා ඔහුගෙන් පිළිතුරක් හෝ ගිණුම් අංකයක් මා හට නොලැබුණු බැවින් මා ඉන්පසු විමසන්නට ගියේද නැත.

**මුදල් ඉල්ලීම**

2023-02-20 උදෑසන 8 පමණ මට සන්නස්ගල මහතාගෙන් සාමාන්‍ය දුරකතනයට ඇමතුමක් ලැබිණි. එහිදී ඔහු සඳහන් කලේ ඔහුගේ සිනමා පටය සඳහා සිංදු කිහිපයක් නිර්මාණය කරන බවත්, ඉන් එක සිංදුවකට දැනටමත් ගාල්ල ප්‍රදේශයේ උපකාරක පන්ති කරන ගුරුවරයෙකු අනුග්‍රහය දක්වා ඇති බවත්, තවත් එක සින්දුවක් ඉතිරිව ඇති බවත් ලක්ෂ දහයක් ගෙවා එහි අනුග්‍රාහකත්වය ලබා ගන්නා ලෙසත්ය. එම අනුග්‍රහය වෙනුවෙන් ඔහු එම සින්දුවේ අවසානයේදී අනුග්‍රහකයකු ලෙස මගේ නම සඳහන් කරන කරන බැව් ද දන්වා සිටියා.

එයට පිළිතුරු වශයෙන් මා සඳහන් කර සිටියේ මට ඒ ගැන හරි හැටි අවබෝදයක් නැති බවත්, මගේ බිරිඳ සමග සාකච්චා කර දැනුම් දෙන බවත්ය. නමුත් එදින මගේ බිරිඳ ඩෙංගු උණ සෑදී අසනීපව සිටි නිසා මා ඒ පිළිබඳව ඇය සමග සාකච්චා කිරීමට ගියේ නැත. මා හටද ඒ ගැන පැහැදීමක් හෝ උනන්දුවක් තිබුනේද නැත.

මා නිහඬව පැය කිහිපයක් යත්ම සන්නස්ගල මහතාගෙන් නැවත Whatsapp වෙත message එකක් සහ voice message එකක් ලැබිණි. එහි සාමාන්‍ය message එකෙන් ඔහුගේ බැංකු ගිණුමේ විස්තර සඳහන් කර තිබුණි. Voice message (අමුණා ඇති හඬ පට වල voice-clip-01) ඉන් ඔහු ඉල්ලා සිටියේ හැකිනම් message එකේ සඳහන් ඔහුගේ පෞද්ගලික බැංකු ගිණුමට රුපියල් මිලියනක් (Rs. 1,000,000) බැර කරන ලෙසත්, එය ඔහු මාසයක් ඇතුලත ආපසු ලබාදෙන බවත්, මුදල ආපසු

ලබාදුන් පසු  මා කැමතිනම් පමණක් ඔහුගේ නිර්මාණයේ crouwdfunding වලට මා කැමති මුදලක් පරිත්‍යාග කරන ලෙසත් ය.

ඔහු දිගින් දිගටම නොයෙක් ස්වරූපයෙන් මුදල් ඉල්ලා සිටි නිසා සහ මසකින් නැවත ලබාදෙන බවට ලබා දුන් පොරොන්දුව නිසාත් 2023-02-20 දින දහවල් 12:25 මා ඔහුගේ සම්පත් බැංකු ගිණුම වන ගිණුම් අංක **013550003737** වෙත ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ දහයක් (1,000,000) මගේ සම්පත් බැංකු ගිණුම වන **107657410094** වෙතින් මාර්ගගත ක්‍රමය හරහා බැර කළේය. (අමුණා ඇති සාක්ෂි online-trafer-bank-slip)

ඉන්පසු මා Whatsapp voice message එකක් යවමින් සඳහන් කර සිටියේ, මා ඔහු ඉල්ලු මුදල සඳහන් කල ගිණුමට බැර කල බවත්, එය පරික්ෂා කරන ලෙසත් ය. මා පෙර ඔහුට සඳහන් කර තිබු පරිදි මෙම මුදල් මා ඉඩමක් මිලදී ගැනීම සඳහා ඉතුරු කරගත් මුදල් නිසා ඉඩම මිලදී ගැනීමට පෙර පරික්ෂා කර බැලීමට ඇති බැවින් තව සුළු කාලයක් මුදල් ආපසු ලබා ගැනීමට ගතකල හැකි බවද දන්වා සිටියෙමි. (අමුණා ඇති හඬ පටය voice-clip-02)

**මුදල් ආපසු ඉල්ලීම සහ ගෙවීම පැහැර හැරීම**

සන්නස්ගල මහතා පොරොන්දු වූ පරිදි මුදල් ආපසු ලබා දීම 2023-03-20 වන දිනට පෙර ලබා දීමට නියමිතව තිබුනද, මා හරියටම මසකින් මුදල් ආපසු ඉල්ලුවේ නැත. ඔහුද ඉන්පසු ඒ පිලිබඳ කතා කලේද නැත. නමුත් මගේ ඉඩම මිලදී ගැනීම මට මුදල් නොමැති කමින් දිනෙන් දින ආපස්සට යන නිසා මට මුදල් ආපසු ඉල්ලීම හැර වෙන විකල්පයක් නොවිණි. එම නිසා මම 2023-04-03 වන දින Whatsapp හරහා පණිවිඩයක් යවමින් සඳහන් කලේ මගේ ඉඩම මිලදී ගැනීමට මුදල් නැති නිසා මගෙන් ගත් මුදල් ආපසු ලබාදෙන ලෙසත්ය.

එයට පිළිතුරු වශයෙන් එදිනම ඔහු voice message එකක් එවමින් සඳහන් කර සිටියේ (අමුණා ඇති හඬ පටය voice-clip-03) සිනමා පටයේ වැඩ නිසා ඔහු කාර්යබහුල වූ බවත්, මැයි මස වන විට ඔහුට මුදල් ලැබෙන බවත්, ඔහුගේ royal thaprobanian ගොඩනැගිල්ල විකිනීමට සුදානම් කර ඇති බවත් එතෙක් ඉවසන ලෙසත්, මුදල් ලබා දීම පිලිබඳ ස්තුතිවන්ත වන ලෙසත්, අපහසුතාවයක් සිදු එනේනම් කණගාටු වන ලෙසත්ය.

ඉන්පසු මා voice message එකක් යවමින් සඳහන් කර සිටියේ (අමුණා ඇති හඬ පටය voice-clip-04) මා හට ඔහු සඳහන් කල දිනය වන තුරු බලපොරෝතුවෙන් සිටිය හැකි බවත්, මුදල් ලද වහාම දැනුම් දෙන ලෙසත් ය.

ඉන්පසු මා ඔහු සඳහන් කල පරිදි මැයි මසද මුදල් නොලැබෙන බැව් තේරුම් ගත් නිසා 2023-05-23 වන දින whatsapp පණිවිඩයක් යවමින් මුදල් පිලිබඳ විමසා සිටියේය. එයට එදිනම ඔහු පිළිතුරක් එවමින් සඳහන් කර සිටියේ “ඉක්මනින් ම කෝල් එකක් දෙන්නම්” යන්නය (අමුණා ඇති චයරූප IMG_1)

නමුත් 2023-06-05 වන දින දක්වා ඔහු කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වූ නිසා මම නැවත එදින whatsapp පණිවිඩයක් යවමින් සඳහන් කර සිටියේ මා ඔහුට දුරකථන ඇමතුමක් ලබා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින නිසා ඔහු කාර්යබහුල නොවන වෙලාවක් දැනුම්දෙන ලෙසත්ය. (ඇමුණුම IMG_2)

ඉන් දිනකට පසු එනම් 2023-06-06 වන දින ඔහු පණිවිඩයක් එවමින් සඳහන් කර සිටියේ "චුට්ටක් අවුල් බිසී දවසක් . අද කෝල් එකක් ගන්නම්" යන්නය (ඇමුණුම IMG_2)

නමුත් ඔහු කිසි විටකත් පොරොන්දු වූ පරිදි මා හට දුරකථන අමන්තුමක් ලබා ගත්තේ නැත. 2023-06-09 වන දින තෙක්ම ඇමතුමක් නැති තැන මම ඔහුට නැවත පණිවිඩයක් යවමින් සඳහන් කලේ "සර් free වෙලාවක් නම් කියන්න මම call එකක් ගන්නම්." (ඇමුණුම IMG_2)

එහෙත් එයටද පිළිතුරක් නොවිණි. ඉන්පසු මා නැවත පසු දින එනම් 2023-06-10 දින පණිවිඩයක් යවමින් සඳහන් කලේ "Sir, I wish to have a call with you soon." (ඇමුණුම IMG_2) එයට පිළිතුරක් ලෙස ඔහු සඳහන් කලේ ඔහු "මං ඩොක්ටර් ළඟ .කෝල් කරන්නම්" යන්නය. (ඇමුණුම IMG_2)

ඉන්පසු ඔහු එදිනම නැවත voice message එකක් එවමින් සඳහන් කර සිටියේ, ඔහු බෙහෙත් රැගෙන අවේ දැන් බවත්, ඔහුගේ හපුතලේ ඇති පර්චස් 100ක ඉඩම විකිණීමට අදහස් කරන බවත්, නුවර වැව රව්මේ ඇති පර්චස් අටක ඉඩමද විකිනීමට ඇති බවත් ඔහුගේ නුගේගොඩ ඇති thaprobane ගොඩනැගිල්ලද විකිනීමට ඇති බවත්, මට පමණක් නොව තව තව කුඩා ගනුදෙනු ඔහු තවත් අයගෙන් කරගෙන ඇති බවත්, පියවා ගැනීමට අපහසු වීම නිසා ඔහු ඉන් ලජ්ජාවට පත්ව ඇති බවත්, ඒ කෙසේ වෙතත් මගෙන් ලබා ගත රුපියල් මිලියනය හැකි ඉක්මනින් ආපසු ලබා දෙන බවත්ය. (ඇමුණුම IMG_2)

ඉන්ප්සසු මා voice message එකක් යවමින් අසා සිටියේ ඇමතුමක් ලබාගැනීමට හැකිද යන්නයි (ඇමුණුම IMG_2)
ඉන්පසු ඔහු පිළිතුරක් එවමින් සඳහන් කලේ ඔහු ප්‍රතිකාර ගනිමින් සිටින නිසා පසු දින උදේ 10 ඇමතුමක් ලබා ගන්නා ලෙසයි (ඇමුණුම IMG_2)

ඉන්පසු මාද එයට එකඟ වූ අතර ඔහුට ඉක්මන සුවය පැතීය (ඇමුණුම IMG_2)

නමුත් මා පසු දින සම්හන්ද වීමට උත්සහ කලද, ඔහු සම්හන්ද කර ගැනීමට හැකි නොවිණි.

ඉන්පසු කිසි පිළිතුරක් නැති තැන 2023-07-04 වන දින මා පණිවිඩයක් යවමින් සඳහන් කලේ "සර්, අර වැඩේ සම්බන්දයෙන් මොකක් හරි update එකක් තියෙනවද? තවත් ප්‍රමාද උනොත් මට ඉඩම ගන්න වැඩේ මග ඇරෙනවා, ඉඩම අයිති කෙනා මාව ටිකක් pressure කරනවා මොකද මම advance එකක් දීලා නිසා වෙන කාටවත් දෙන්නත් බෑ කියලා.
පුළුවන් නම් මට ලක්ෂ 5 වගේ arrange කරලා දෙන්න please."

එදිනද එයට ඔහුගෙන් ප්‍රතිචාරයක් නොවිය. (ඇමුණුම IMG_3)

ඉන්පසු පසු දින එනම් 2023-07-05 වන දින මම voice message එකක් යවමින් සඳහන් කර සිටියේ පෙර දින මා එවූ පණිවිඩයට පිළිතුරක් ලබා දෙන ලෙසත්, තවත් මුදල් ප්‍රමාද උවහොත් මට ඉඩම මිලදී ගැනීම මග හැරෙන බවත් ය. (ඇමුණුම IMG_3)

එයටද ඔහුගේ පිළිතුර වුයේ “අද කෝල් එකක් දෙන්නම්” යන්නය (ඇමුණුම IMG_3)

ඉන්පසු ඔහුගෙන් පිළිතුරක් නැති තැන මම නැවත ඔහුට 2023-07-11 දින  පණිවිඩයක් යවමින් සඳහන් කලේ හැකිනම් මට අවම ලක්ෂ 5 මුදලක් දැනට ලබා දෙන ලෙසයි (ඇමුණුම IMG_3) ඉන්පසු එයටද ඔහුගෙන් සාදනිය පිළිතුරක් නොවිණි.

නැවත මම ඔහුට 2023-07-17 වන දින පණිවිඩයක් යවමින් මුදල් දීම කාලයම සහ මග ඇරීම පිළිබඳව මගේ අප්‍රසාදය පල කලේය.

Sir, to be honest I’m totally disappointed about your behavior. I believed that you are a man of your word and I didn’t think it’ll go this wrong.
Now, I feel so sorry about myself that I dedicated my dream to make your one a reality and now you really don’t care about your responsibility.”

(ඇමුණුම IMG_4)

එදිනම ඔහු එයට පිළිතුරක් ලෙස, විශ්වාසවන්ත භාවය පිලිබඳ ගැටළුවක් නැති බවත්, ඔහු ඔහුගේ ජිවිතයේ අවංක බව කිසි විටකත් පලුදු කර නොගන්න බවත්, ඔහුගේ අතින් සිදු වූ අතපසු වීම් වලට මා වගකිය යුතු නැති බවත්, ඔහු දිගින් දිගටම අසනීප වූ බවත්, නමුත් දැන් සුවය ලබා ඇති බවත්, ඔහුගේ හපුතලේ පර්ස්චස් 100ක ඉඩම ලක්ෂ 150 මිල නියම කර ඇති බවත්, ඔහුගේ ඒ ඉඩම මට ලබා දිය හැකි බවත්, ඉතිරි මුදල කවදා ලබා දුන්නද ප්‍රශ්නයක් නැති බවත් පවසා සිටියා. තවද ඔහුගේ නුවර සහ නුගේගොඩ ඇති දේපල පිළිබඳවද සඳහන් කළේය ( අමුණා ඇති හඬ පට voice-clip-11)

ඉන්පසු මාද බණ්ඩාරවෙල හපුතලේ අවටින් ඉඩමක් සොයන නිසා, ඔහුගේ යෝජනාව පරිදි මට පර්චස් සියයක් මිලදී ගත නොහැකි බවත්, ඔහු කැමති නම් පර්චස් 25 පමණ මිලදී ගත හැකි බවත් දන්වා සිටියා. (අමුණා ඇති හඬ පටය voice-clip-12)

එයට ප්‍රතිචාරයක් ලෙස ඔහු “මං හිතලා කෝල් එකක් දෙන්නම්.ඒ නැතත් ඔයාගෙ මුදල් ඉක්මණින් ම දෙනවා” යන පණිවිඩය එවා තිබුනා. (ඇමුණුම IMG_4)

ඉන්පසු ඔහුගෙන් කිසිම ප්‍රතිචාරයක් ලැබුනේ නෑ, ඉන්පසු මම 2023-09-04 වන දින සිට නිතරම ඔහුගෙන් මුදල් ලැබෙන දිනයක් ගැන අසමින් whatsapp messages යොමු කලත් ඔහු ඒ කිසිවකට ප්‍රතිචාර දැක්වුයේ නෑ.

ඉන්පසු මා 2023-10-14 වන දින දුරකථන ඇමතුම් කීපයක් ගත් නමුත් ඒ කිසිවක් ඔහු answer කලේ නෑ. නමුත් මම දිගින් දිගටම ඇමතුම් ලබාගැනීම නිසා ඔහු අන්තිමට answer කළා. ඔහු මට කතකිරීමටවත් ඉඩ නොතබා මට පවසා සිටියේ "නුවන් මම ඔයාගේ සල්ලි දෙනකන් ආයේ ගන්නේ ණෑ" කියයි. ඉන්පසු මා කිසිවක් කීමට පෙර ඔහු දුරකථනය විසන්දි කළා.

ඉන්පසු මා ඔහුට දිගින් දිගටම පවසා සිටියේ මුදල් ලබා දෙන ලෙසත් එසේ නොවුවහොත් මා නිතිය ඉදිරියට යන බවත්ය.

ඉන්පසු ඔහු පිළිතුරු වශයෙන් පවසා තිබුනේ
"ෆිල්ම් එකට කන්ට්‍රිබියුෂන් කියලා සල්ලි දුන්න අය මෙහෙම හැසිරෙනවා දැන්.
කරන්න දෙයක් නෑ.
ඒයාලගේ සල්ලි කවදාහෝ දෙන්න ඕන.
නීතිය කියන්නේ පොලීසිය සහ උසාවිය.
කරන්න දෙයක් නෑ.
ෆේස් කරන්න වෙනවා."
(ඇමුණුම IMG_6)
යනුවෙනුයි.

මා මුදල් දෙන විට කිසිම විටකදී මේ මුදල් දෙන්නේ ෆිම්ල් එකට යයි පවසා නැත, එසේ දුන්නේනම් දෙන්නේ කලින් නලින්ද ප්‍රේමරත්න මහතා පැවසු පරිදි නීතිඥ වරයෙකුගේ ගිවිසුමක් මගිනි. එමෙන්ම ඔහු මගෙන් මුදල් ඉල්ලා සිටිමේදීද පවසා සිටියේ මසක් ඇතුලත සල්ලි ආපසු දී පියවා දමන බවකි. මා ඔහුගේ ඒ පොරොන්දුව මත සහ ඔහු ලංකාවේ කීර්තිමත් පුද්ගලයකු නිසා ඇති වූ විශ්වාශය මත ඔහුට මුදල් ලබා දුනිමි.

ඉන්පසු මා පිළිතුරු වශයෙන් whatsapp පණිවිඩයක් යවමින් දන්වා සිටියේ, මා ඔහුගේ නිර්මාණයට යම් දායකත්වයක් දැරීමට කැමැත්තෙන් සිටියත් මෙවන් විශාල මුදලක් දැරීමට කිසිම බලාපොරොත්තුවක් නොතිබූ බවත්, ඔහුට මගෙන් ගත් ලක්ෂ දහයම පියවීමට යම් අපසුතාවයක් ඇතිනම්, අවම වශයෙන් ලක්ෂ 7ක් වත් ගෙවන ලෙසත් ඉතුරු ලක්ෂ තුන මගෙන් පරිත්‍යාගයක් ලෙස තබා ගන්නා ලෙසත්ය. (ඇමුණුම IMG_6)

නමුත් ඔහු එයට පිළිතුරු ලෙස දන්වා සිටියේ ඔහු ලක්ෂ දහයම ආපසු දෙන බවකි (ඇමුණුම IMG_6)

ඉන්පසු මා ඉතා විශාල වාර ගණනක් මුදල් ගැන විමසමින් පණිවිඩ යොමු කලද ඔහු ඒ කිසිවකට ප්‍රතිචාර දැක්වුයේ නැත. මා ඔහුට මා වැටි ඇති කරදරය ඒත්තු යන ලෙසද පණිවිඩ ගණනාවක් යොමු කලද ඔහු ඒ කිසිවක් ගණන් ගත්තේද නැත.

**මුදල් ආපසු ඉල්ලීමට තැප්‍රෝබේනයට යාම**

ඔහු මගේ දුරකතනයට ප්‍රතිචාර නොදැක්වීම හා පණිවිඩ නොසලකා හැරීම තුල අන්තිමේදී මා ඔහු සිටිනා තැනට ගොස් මුදල් ඉල්ලීමට තීරණය කර ගත්තේය, එබැවින් මා 2024-03-24 වන දින විජේරාමයේ ඇති ඔහුගේ Royal Thaprobaniyan වෙත ගියේය. එහිදී ඔහු හමු වූ අතර ඔහු තර්ජනාත්මකව පවසා සිටියේ “හැකිනම් පොලිසි යන ලෙසත්, පොලිසිය මගින් මුදල් ආපසු ලබාගන්නා ලෙසත්, ඔහුගේ ස්ථානයෙන් වහාම පිටවන ලෙසත්ය”

එහිදී ඔහු බලගතු පුද්ගලයකු යයි හැගෙන කෙනෙකුට දුරකථන ඇමතුම් ලබා ගැනීමට උත්සහ කලද අනෙත් පසින් ප්‍රතිචරා නොදැක්වූ බව දැක ගන්නට ලැබිණි. අපද අපේ ආරක්ෂාව පතා එම ස්ථානයෙන් පිටත්ව ආවෙමු.

—-----------------------

**මා ඔහුට ලබා දුන් සෑම රුපියලක්ම මා දාඩිය මහන්සියෙන් උපයා එකතු කර ගත් මුදල් වේ. එමෙන්ම මා එම සල්ලි ඉතුරු කලේ මගේ අනාගතය වෙනුවෙන් ඉඩමක් මිලදී ගැනීමටය. සන්නස්ගල මහතා මෙරට කීර්තිමත් පුද්ගලයකු යයි විශ්වාස කල නිසාත්, ඔහු ලබාදුන් පොරොන්දුව නිසාත් මා මගේ සිහිනය කල් දමා, මසකින් ආපසු දෙන පොදොන්දුව මත රුපියල් මිලියනයක් ලබා දුනිමි.**

**නමුත් ඔහු මනුෂත්වයටද නිගා වන අයුරින් මගේ ඒ මුදල් ආපසු දීම මග හරින අතරම මා හට හැකිනම් පොලිසි ගිහින් මුදල් ආපසු ලබා ගන්නා ලෙස තරජනයද කරයි.**

**දැන් මා හට ඉතිරිව ඇත්තේ නීතියේ පිළිසරණ පැතීම පමණකි, නිතිය සහ යුක්තිය පිළිබඳව දැඩි විශ්වාසයකින් පසු වන මා, මේ කරුණ සම්භන්දයෙන් මා හට සදරයනක් ඉටු වන තුරු බලා සිටිමි.**